දූවිලි තැවරුණු හිසකෙස් අවුල් වුණු කොපමණ පුද්ගලයන් දොරකඩවල්වලින් ඉවතට හරවා යවනු ලබනු ඇත් ද!. එවැන්නෙක් අල්ලාහ්ගේ නාමයෙන් යමක් දිවුරා සිටියේ නම් ඔහුට එය ඉටු කර දෙනු ඇත

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "දූවිලි තැවරුණු හිසකෙස් අවුල් වුණු කොපමණ පුද්ගලයන් දොරකඩවල්වලින් ඉවතට හරවා යවනු ලබනු ඇත් ද!. එවැන්නෙක් අල්ලාහ්ගේ නාමයෙන් යමක් දිවුරා සිටියේ නම් ඔහුට එය ඉටු කර දෙනු ඇත."
[صحيح] [رواه مسلم]

හිසට තෙල් ගල්වන්නේ නැති, වැඩි පුර නාන්නේ නැති, මිනිසුන් අතර ඔවුනට බලයක් නැති, දූවිලිවලින් තැවරුණු හිසකෙස් අවුල් වුණු පුද්ගලයින් මිනිසුන් අතර සිටින බවත්, ඔවුන්ගේ දොරකඩවල්වලින් ඔවුන්ව මිනිසුන් විසින් වළක්වනු ලබන බවත් ඔවුන් අවමානයක් ලෙස සළකා ඔවුන් පළවා හරින බවත්, නමුත් යමක් සිදු විය යුතු යැයි එවැන්නෙකු දිවුරා සිටියේ නම් ඔහුට කරන උපකාරයක් ලෙස ඔහුගේ ඉල්ලීමට අල්ලාහ් පිළිතුරු දෙන බවත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා සිටියහ. ඔහු අල්ලාහ්ගේ නාමයෙන් යමක් දිවුරා සිටියේ නම් අල්ලාහ්ට එය ඉටු කර දෙනු ඇත. ඔහුගේ දිවුරුම ඔහු ආරක්ෂා කරනු ඇත. එය අල්ලාහ් අභියස ඔහුට ඇති ඔහුගේ මහිමය හා ඔහුගේ නිලය හේතුකොටගෙනය.

https://sunnah.global/hadeeth/si/show/3715